# 22 අපේ සම්පත් අපි ම සුරකිමු

අප සතු ව ඇති මිල මුදල්, ඇඳුම් පැළඳුම්, යාන වාහන, බඩු භාණ්ඩාදිය මෙන් ම පරිසරයේ ඇති අපගේ ප්‍රයෝජනයට ගන්නා වස්තු, සම්පත් ලෙස හැඳින්විය හැකි ය. මේවා කෘත්‍රිම සම්පත් හා ස්වාභාවික සම්පත් ලෙස වර්ග කෙරේ. අපගේ ආශාවන් සපුරාගැනීමට තරම් අවශ්‍ය කරන සම්පත් අප සතු ව නැත. එහෙත් අවශ්‍යතාවන් ඉටු කර ගැනීමට තරම් සෑහෙන දේ අපට සොයා ගැනීමේ හැකියාව ඇත.

විශේෂයෙන් පුද්ගලයා දිළිඳුභාවයට පත් වන්නේ තමන් සතු ව සම්පත් සුරැකීමේ විධිමත් ක්‍රමෝපායන් නොමැතිකම නිසා බව බුදුසමය පෙන්වා දෙයි. කෙනෙක් දුසිරිතෙහි නිරත වීම නිසා සම්පත් විනාශ වී ජීවිතය අසාර්ථක කර ගනී. තවත් කෙනෙක් දුසිරිත්වල නොයෙදුන ද මනා කළමනාකරණයක් නොමැති කම නිසා ජීවිතය අසාර්ථක කර ගනී. එනිසා බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ පුද්ගලයා සතු ව මනා සම්පත් කළමනාකරණයක් තිබිය යුතු බවයි. හැදෙන වැඩෙන දරුවන් ලෙස අප ද සම්පත් හොඳින් පරිහරණය කිරීමට හා ආරක්ෂා කිරීමට පුරුදු විය යුතු ය.

තමන් සතු ධනය විනාශ කර ගෙන පුද්ගලයා ජීවිතය අසාර්ථක කර ගන්නා අයුරු බුදුරජාණන් වහන්සේ සිගාලෝවාද, ව්‍යග්ඝපජ්ජ වැනි සූත්‍ර දේශනාවන්හි දී පෙන්වා දී ඇත. කෙනකුට සිය පරම්පරාවෙන් සම්පත් උරුම වෙයි. තවත් කෙනෙක් දුක් මහන්සි වී සම්පත් උපයා ගනිති. මේ කුමන අයුරකින් තමාට සම්පත් හිමි වුව ද ඒවා මනා ව කළමනාකරණය කළ යුතු ය. තමා සතු සම්පත් විනාශ කර ගන්නා පුද්ගලයින් සිවු දෙනකු පිළිබඳ තොරතුරු ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් වෙයි.

1. ස්ත්‍රී ධූර්තයා
2 සුරා ධූර්තයා
3. සූදුවෙහි යෙදෙන්නා
4. පවිටු මිතුරන් ඇසුරු කරන්නා

මහත් වූ විලක් වේ. එහි ජලය ඇතුළු වන මාර්ග සතරකි. ජලය පිටවන මාර්ග සතරකි. පුද්ගලයා සතු සම්පත් විල නම් ධනෝපායන මාර්ග ජලය ඇතුළු වන මාර්ග ලෙස නම් කළ හැකි ය. මෙම විලෙහි ජලය පිටවන මාර්ග සතර ලෙස ඉහත සඳහන් අපාය මුඛ හෙවත් වැරැදි චර්යාවන් සතර පෙන්වා දෙයි. යම් කෙනකු මෙම විලෙන් ජලය පිටවන මාර්ග සතර වසා නො තැබුව හොත් විලට එකතු වන ජලය නොරැඳී විල හිස්වන්නේ ය. එසේ ම පුද්ගලයකු තමාගේ ධන විනාශ මුඛ සතර වසා නො තැබුව හොත් ඔහු සතු ධනය විනාශ වී ජලය හිස් වූ විල මෙන් ධනයෙන් පිරිහුන පුද්ගලයකු බවට පත් වේ.

ධනය විනාශ වන ක්‍රම හයක් (06) පිළිබඳ ව බුදුරජාණන් වහන්සේ සිගාලෝවාද සූත්‍රයේ දී පෙන්වා දී ඇත. යම් පුද්ගලයකු සතු ව එම දුබලතා එකක් හෝ ඇත්නම් ඔහු සතු ධනය විනාශ වී දිළින්දකු බවට පත්වේ.

1. මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීම
2. අවේලාවේ මහමඟ ඇවිදීම
3. නෘත්‍ය, ගීත, ක්‍රීඩාදියෙහි දැඩි ඇල්ම
4. සූදු ක්‍රීඩාවෙහි යෙදීම
5. පාපමිත්‍ර සේවනය
6. අලසකම

ඉහත සඳහන් ආකාරයට ධනය විනාශ වන ක්‍රම ඉදිරිපත් කරන බුදුරජාණන් වහන්සේ එම එක් එක් කරුණ නිසා සිදුවන අනර්ථයන් ද පෙන්වා දී ඇත. අපි එම අයහපත් හැසිරීම්වල ඇති ආදීනව මොනවා ද යි විමසා බලමු.

## මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීම

මත්ද්‍රව්‍ය පුද්ගලයාගේ කායික හා මානසික සුවය විනාශ කරයි. යම් පුද්ගලයකු මත්ද්‍රව්‍ය පාවිච්චි කරයි නම් ඔහුට පරිහානි හයකට මුහුණ පෑමට සිදුවන බව සිගාලෝවාද සූත්‍රයේ පෙන්වා දී ඇත.

1. ආර්ථික පරිහානිය
2. සාමාජික පරිහානිය
3. සෞඛ්‍ය පරිහානිය

4. ආත්ම ගෞරවය නැති වීම
5. ලජ්ජා භය නැති වීම
6. බුද්ධිමය පරිහානිය

## අවේලාවේ මාර්ගවල ඇවිදීම

අපට අවශ්‍ය ගමන් බිමන් යෑම සඳහා සුදුසු වේලාවක් තිබේ. රාත්‍රී කාලයේ දී මෙන් ම නුසුදුසු වේලාවන්හි දී ගමන් බිමන් යෑම නො කළ යුතු ය. එසේ අවේලාවේ මාර්ගවල ඇවිදීමට යාම නිසා අපට විඳීමට සිදුවන හිරිහැර හයකි.

1. තම ජීවිතයට සොර සතුරන්ගෙන් හානි ඇති වේ
2. ගෙදර අයට සතුරු උපද්‍රව ඇති වේ
3. මිල මුදල්, භව භෝග ආදිය සොරු පැහැර ගනිති
4. තමා සැක කටයුතු පුද්ගලයකු බවට පත් වේ
5. නින්දා අපහාසවලට හා සැකයට ගොදුරු වේ
6. නොයෙක් දුක් කම්කටොලු ආදියට භාජන වේ

## නෘත්‍ය, ගීත, ක්‍රීඩාදියෙහි දැඩි ඇල්ම

නාට්‍ය බැලීම, ගීත ඇසීම හා ගායනය, ක්‍රීඩා කිරීම හා නැරඹීම ආදිය අපේ ජීවිතයට අවශ්‍ය කරුණු ය. මේ තුළින් අපේ සතුට වර්ධනය වේ. එහෙත් මේවා පිළිබඳ ගිජුකම අප ජීවිතයට හානිකර වේ. මේවායේ ඇලී ගැලී සිටීම නිසා අපගේ වටිනා කාලය මෙන් ම මිල මුදල් ද වියදම් වේ. මේ තුළින් පුද්ගලයාගේ දියුණුව නැති වී ගොස් පිරිහුණු අවස්ථා අපට දැකිය හැකි ය. ඉගෙන ගන්නා දරුවන් ලෙස අප මේවා පිළිබඳ දැඩි ගිජුකමින් කටයුතු නො කළ යුතු ය. නාට්‍ය, ගීත, ක්‍රීඩාදිය අපගේ කායික හා මානසික සුවය හා ජීවනෝපාය සඳහා යොදා ගැනීම සුදුසු ය. එහෙත් පමණ දැන කටයුතු කිරීම වැදගත් වේ.

## සූදු ක්‍රීඩාවෙහි යෙදීම

පුද්ගල ජීවිතයක් අසාර්ථක වීමට බලපාන තවත් ප්‍රධාන කරුණකි සූදුව. මේ තුළින් පුද්ගලයාගේ පරිහානිය සිදු වේ. මුදල් නැති නාස්ති වන්නා සේ ම, සමාජයේ පිළිගැනීමට ලක් නොවන්නෙක් ද වන අයුරු පෙන්වා දී ඇත. එහි දී සූදුවෙහි ආදීනව හයක් දැක්වේ.

1. දිනූ කල සතුරන් ඇති වේ
2. පැරදුණු පසු සිත් තැවීම් ඇති වේ.
3. වස්තුව විනාශ වේ
4. සමාජය සූදුකරුවකුගේ වචන නො පිළිගනියි
5. යහපත් මිතුරන්ගේ අවඥාවට ලක් වේ
6. ආවාහ විවාහ අවස්ථාවල දී ප්‍රතික්ෂේප වේ

## පාපමිත්‍ර සේවනය

හැදෙන වැඩෙන දරුවන් වන අපට මෙන් ම සමාජයේ සැම දෙනාට ම පාහේ මිතුරන් ඇත. මිතුරා යනු අපේ ජීවිතයට බලපාන ප්‍රධාන පුද්ගලයෙකි. සමාජයේ දෙයාකාරයක මිතුරෝ සිටිති. කලණ මිතුරන් හා පාප මිතුරන් යනුවෙනි. අපේ ජීවිතය මෙලොවින් මෙන් ම පරලොවින් ද යහපත් කිරීමේ හැකියාව කල්‍යාණ මිත්‍රයකුට ඇත. එවැනි මිතුරන් අප ඇසුරු කළ යුතු ය. අපේ ජීවිතය අවාසනාවන්ත කරන, සම්පත් විනාශ කරන, පාප මිත්‍ර සේවනය, අත්හළ යුතු ය. එහි දී පාප මිත්‍රයකු ඇසුරු කිරීමෙන් අප පත්විය හැකි අවාසනාවන්ත තත්ත්වයන් හයකි.

1. සූදුකාරයෙක් වේ
2. සල්ලාලයෙක් වේ
3. බේබද්දෙක් වේ
4. අප්‍රකට වංචාකාරයෙක් වේ
5. ප්‍රකට වංචාකාරයෙක් වේ
6. මං පහරන හා ගම් පහරන සාහසිකයෙක් වේ

## අලසකම

අලසකම ජීවිතයක් අසාර්ථක වීමට බලපාන ප්‍රධාන කරුණකි. අලසයා සතු ව ධනය ඇත්නම් ඒ ධනය ඉක්මනින් විනාශ වේ. එසේ ම නැවත ධනය ඉපයීම ඉතා ම අපහසු ය. එයට හේතුව ඔහු කිසියම් කර්මාන්තයක යෙදීමට මැලිකමක් දැක්වීමයි. ඔහු කුමන හෝ හේතුවක් නිර්මාණය කරගෙන වැඩ පැහැර

හරියි. අප ද අලසකම දුරු කළ යුතු ය. අලසයා තමාගේ වැඩ අතපසු කිරීමට යොදා ගන්නා කරුණු හයක් සිගාලෝවාද සූත්‍රයෙහි සඳහන් වෙයි.

1. ඉතා ශීත යයි වැඩ නො කරයි
2. ඉතා උෂ්ණ යයි වැඩ නො කරයි
3. ඉතා සවස් වී යයි වැඩ පමා කරයි
4. උදේ වැඩි යයි පමා කරයි
5. බඩගින්න වැඩි යයි පමා කරයි
6. ආහාර ගැනීමෙන් පසු බඩ පිරී ඇතැයි පමා කරයි

ඉහතින් දක්වන ලද්දේ අපගේ සම්පත් විනාශ වන්නට ප්‍රධාන වශයෙන් හේතුවන කාරණා හයකි. හොඳ දරුවන් ලෙස මේවා දැන ගෙන ඒවායින් වැළකිය යුතු ය. වැරදි ප්‍රතිපත්ති ඇති තැනැත්තාගේ සම්පත් අනිවාර්යයෙන් ම විනාශය කරා ළඟා වන්නේ ය. එසේ ම දුරාචාරයන්ගෙන් වෙන් ව යහපත් ජීවිතයක් ගෙවන අයගේ පවා දිළිඳු බව, ධනය ඉතිරියක් නොමැති බව ආදී ලක්ෂණ දැකිය හැකි ය. මෙයට හේතුව ද අප විමසා බැලිය යුතු ය. කෙනකු දුරාචාරයෙන් මිදුන පමණින් ම ඔහුට පොහොසතෙක් විය නොහැකි ය. ඔහු සතු ව හොඳ උත්සාහයක් හා යහපත් කළමනාකරණ ප්‍රතිපත්තියක් තිබිය යුතු ය.

පුහුණුවට

ඉත්ථීධුත්තෝ සුරාධුත්තෝ
අක්ඛධුත්තෝ ච යෝ නරෝ,
ලද්ධං ලද්ධං විනාසේති
තං පරාභවතෝ මුඛං.

යම් කෙනකු ස්ත්‍රී ධූර්ත වේ ද, සුරා ධූර්ත වේ ද, සූදුවෙහි ඇලුනාහු ද ඔහු උපයන සියලු ධනය විනාශ වෙයි. එසේ වන්නේ ඒවා පිරිහීමේ මාර්ග නිසා ය.

**සාරාංශය**

සම්පත් විනාශ වන මුඛ පිළිබඳ කරුණු සිඟාලෝවාද සූත්‍රයේ මෙන් ම ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ද සඳහන් වේ. සිඟාලෝවාද සූත්‍රයේ ධනය විනාශ වන මුඛ සයක් පිළිබඳ ව කරුණු දැක්වේ. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී ධන විනාශ මුඛ සතරක් පිළිබඳ කරුණු දැක්වේ. ඉහත දක්වන ලද සියලු ධන විනාශ මුඛයන්ගෙන් වෙන් වී මනා කළමනාකරණයක් වෙත අප යොමු විය යුතු ය.

**ක්‍රියාකාරකම**

1. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් ධන විනාශ මුඛ නම් කරන්න.
2. සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් ධන විනාශ මුඛ හය මතකයෙන් කියන්න.
3. "කම්මැලියාට දිවැස් ඇත" යන කියමන පිළිබඳ රචනයක් ලියන්න.
4. ඔබ අන්‍යයන්ට කලණ මිතුරකු වීම සඳහා ඇතිකර ගන්නා ගුණධර්ම මොනවා ද?

**පැවරුම**

පන්තියේ ළමයින් කණ්ඩායම් හයකට බෙදී සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන විනාශ මුඛ හයට අදාළ ව තොරතුරු රැස්කරන්න.